**අම්බලන්ගොඩ නගර සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 14 වන දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය අතර රු.68,357 ක වෙනසක් විය. | ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂයට සමාන විය යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ඇප තැන්පත් ආයෝජන ගිණුමේ ශේෂය රු.71,025 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සේවක ඇප තැන්පත් ශේෂය ඇප තැන්පත් ආයෝජන ගිණුමේ ශේෂයට සමාන විය යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී සභාවට අයත් කැටන්තොට පෙර පාසලේ මිදුල සංවර්ධනය කිරීම සඳහා වැය කරන ලද රු. 998,775 ක වියදම සහ ක්‍රීඩාගාරය සඳහා මිලට ගෙන තිබූ රු.373,700 ක ක්‍රීඩා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාළ වත්කම් ප්‍රාග්ධනගත කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |
| (iv) | 2005 වර්ෂයේදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබූ රු.6,842,682 ක ණය මුදල හා රු.10,311,361 ක පොලිය සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.52,344,424 ක් වූ ගිණුම් විෂයයන් 18 කට අදාළ ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන අනුව දැක්වෙන ශේෂයන් අතර රු.13,782,388 ක වෙනසක් විය. | අදාළ ගිණුම් ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(i) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 20 කට වඩා වැඩි කාලයක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පවතින රු.17,092,768 ක් වූ ගිණුම් ශේෂ 06 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ii) ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 6 සිට 24 දක්වා කාලයක සිට ඉදිරියට ගෙන එන රු.7,588,200 ක් වූ ගෙවිය යුතු ශේෂයන් සහ ඉකුත් වර්ෂ 5 කට අදාළ රු.2,400,174 ක විගණන ගාස්තු නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.85,145,058 ක් වූ ගිණුම් විෂයයන් 10 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | නගරසභා අඥා පනතේ (255 වන අධිකාරිය) 170 (1) (2) වගන්ති | - | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට ආඥා පනත ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට පියවර ගත යුතු වේ. | වරිපනම් සඳහා ජංගම සේවා පවත්වා අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (ඇ) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | 275,614 | තත්කාර්ය අතුරු අග්‍රිමයන් ආදාළ කාර්යය නිමකළ විගස පියවිය යුතු වුවද, 2018 වර්ෂය ආරම්භයේ ලබා ගත් අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර අත්තිකාරම් පියවිය යුතු වේ. | 2019 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | මුදල් රෙගුලාසි 395 (ඇ) | - | සභාවේ බැංකු ජංගම ගිණුම් දෙකක සමාලෝචිත වර්ෂයේ බැංකු සැසඳුම් පිළියෙළ කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර බැංකු සැසඳුම් පිළියෙල කළ යුතු වේ. | බැංකු සැසඳුම් පිළියෙල කිරීමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.39,909,490 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.22,496,098 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තු ආදායම, බිල්කළ ආදායම,රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 14,525,000 | 20,497,155 | 11,409,382 | 23,681,395 | 9,700,000 | 7,376,943 | 8,359,471 | 14,593,622 |
| කුලී | 14,197,000 | 9,186,693 | 8,539,491 | 13,182,082, | 9,438,000 | 8,187,806 | 10,434,541 | 12,534,880 |
| බලපත්‍ර ගාස්තු | 252,500 | 1,111,819 | 1,114,819 | 606,507, | 277,000 | 201,300 | 422,498 | 609,507 |
| වෙනත් ආදායම් | 114,777,933 | 95,262,346 | 123,076,312 | 86,163,590 | 128,739,000 | 101,778,935 | 106,019,023 | 113,977,556 |
| | 143,752,433 | 126,058,013 | 144,140,004 | 123,633,574 | 148,154,000 | 117,544,984 | 125,235,533 | 141,715,565 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත මුළු ආදායම රු.143,752,433 ක් වූ අතර බිල් කල ආදායම රු.126,058,013 ක් විය. රු.141,715,565 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.267,773,578 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.144,140,004 ක් වීමෙන් වර්ෂය අවසානයට හිඟය රු.123,633,574 ක් විය. | ආදායම් හඳුනා ගැනීම් ඇස්තමේන්තු කිරීම බිල් කිරීම හා අයකිරීම නිසි පරිදි කළ යුතු වේ. | ඉදිරියේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂය තුළ අයකර ගතයුතු බදු මුදල රු.35,090,777 ක් වුවද, අයවීම් රු.11,409,382 ක් වීමෙන් වර්ෂය අවසානයට රු.23,681,395 ක හිඟ ශේෂයක් විය. අයවීම් ප්‍රගතිය සියයට 33 ක ඉතා අඩු මට්ටමක පැවතුණි. | හිඟ වරිපනම් අයකර ගතයුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 2.2.4 කුලී ආදායම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂය තුළ අයවිය යුතු මුළු කුලී ආදායම රු.21,721,573 ක් වූ අතර වර්ෂය තුළ අයවීම් රු.8,539,491 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.13,182,082 ක් හිඟ ශේෂයක් විය. | ගිවිසුම් ප්‍රකාර කුලී අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.283,719 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.75,756,932 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රධාන ලේකම්ගෙන් හිඟ මුදල් ලබා ගැනීමට ලිපි යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණනයට ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සභාව විසින් පනවාගෙන තිබූ අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව පිළියෙල කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2016-2019 වර්ෂවල සහභාගිත්ව සිව් අවුරුදු සැලැස්ම අනුව 2018 වාර්ෂික සැලැස්මේ නගර සභා බල ප්‍රදේශයේ පිහිටි ග්‍රාම නිලධාරි වසම් 13ක රු.14,600,000 ක වටිනාකමක් වූ කර්මාන්ත 38ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, ගිවිසුම් ගත වූ වටිනාකම රු.5,223,213 ක් වූ කර්මාන්ත 27 ක් ඉටු කර නොතිබුණි. | වාර්ෂික සැලැස්මට අනුව කර්මාන්ත අවසන් කළ යුතු වේ. | ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) 2017 අප්‍රේල් 20 දිනැති අංක 2015/53 කසල කළමනාකරණ කටයුතු විධිමත් කිරිම මැයෙන් නිකුත් කල චක්‍රලේඛය පරිදි වෙනම කසල කළමනාකරණ ඒකකයන් ස්ථාපනය කර නොතිබු අතර, සභා බල ප්‍රදේශයෙන් එකතු කරන කසල රත්ගම මොන්රොවියාවන්ත කසල අංගනයටත්, සභාවට අයත් හල් වතුර නමැති භූමියටත් දමා තුනිකර පස් දමා වසා දැමීම සිදු කර තිබුණි. | කසළ කළමනාකරණය සඳහා විධිමත් සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී සැලැස්මට සකස් කිරීමට කටයුතු කරමි. |
| (ii) 2003 වර්ෂයේදී රු.79,780 ක් වැය කර පුද්ගලික සමාගමකින් මිලට ගෙන තිබූ කාබනික පොහොර කැබැලි කිරිමේ යන්ත්‍රය එදින සිට කිසිදු ප්‍රයෝජනයක් නොගෙන සභාවේ ගබඩාව තුල රඳවාගෙන තිබුණි. | වත්කම් වලින් උපරිම ප්‍රයෝජනය ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 46 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක සැලැස්මට අනුව පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස සභාව විසින් ආදේශක පදනම මත බඳවා ගෙන තිබූ සේවකයින් 46 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.2,509,213 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| **(ඇ)** | **සේවක ණය** | | |
| | විශ්‍රාම ගිය හා සේවය හැර ගිය සේවකයින් 71 ක ගෙන් අය විය යුතු රු.345,545 ක ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ සේවකයින්ගේ ඇපකරුවන් ගෙන් අයකර ගත යුතු වේ. | අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.3** **වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල පැවති ප්‍රජාශාලා 08 ක් වර්ෂ ගණනාවකින් නඩත්තු කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රජාශාලා අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රජාශාලා නඩත්තු කිරීමට ඇස්තමේන්තුව සකස් කරමින් පවතී. |

**4.** **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1** **අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයන් 06 ක එකතුව රු.15,178,011 ක් වූ අයවැයගත ප්‍රතිපාදන ඉතිරිවීම් තිබුණි. එය සියයට 27 සිට සියයට 60 ක් අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |
| (ආ) | ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලයන්ගේ එකතුව රු.40,964,458 ක් විය. එය සියයට 25 සිට සියයට 71 ක් අතර පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |

**4.2** **විගණන හා කළමනාකරණ කමිටු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| චක්‍රලේඛය ප්‍රකාරව පැවැත්විය යුතු විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |